ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/i/19/01/23

# මාධ්‍ය නිවේදනය

2023 ජනවාරි මස 18 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණි ආදිවාසී නායකයින් කණ්ඩායමක් පැමිණිල්ලක් බාරදෙන ලදී. මෙම කණ්ඩායම ආදිවාසී නායක ඌරුවරිගේ වන්නිල ඇත්තෝගේ මූලිකත්වයෙන් පැමිණි අතර, දඹාන, පොල්ලේබැද්ද, හෙන්නානිගල, වාකරේ, කරකච්චේනයි, තෝකූර් සහ කට්ටපරිච්චන් යන ප්‍රදේශ නියෝජනය කරන ආදිවාසී නායකයින් මේ අවස්ථාවට සහභාගී විය.

මෙහිදී ඉදිරිපත් කරන ලද පැමිණිලි අතර, පහත අංශ කෙරෙහි අවධානය කර තිබුණි.

- ආදිවාසී ජනතාවට විධිමත් වූ ව්‍යාවස්ථාමය පිළිගැනීමක් නොමැතිවීම.
- ආදිවාසී ජනතාවට සුවිශේෂී වූ ආර්ථික, සමාජ, සංස්කෘතික, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය නොවීම.
- ආදිවාසී ජනතාවට සුවිශේෂී වූ ආර්ථික, සමාජ, සංස්කෘතික, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සංවේදීතාවයකින් තොරව නීති ක්‍රියාත්මක කිරීම.
- ආදිවාසී ජනතාවගේ සාම්ප්‍රදායික ජීවනෝපාය හා බැදී ඇති කටයුතු අපරාධමය වරදවල් ලෙස නීති ක්‍රියාත්මක කරන ආයතන හඳුන්වාදී කටයුතු කිරීම.
- ආදිවාසීන්ගේ වාසස්ථාන හා ඔවුන් හා මුතුන්මිත්තන්ගේ භූමි ප්‍රදේශවල සාමකාමීව ජීවත්වීමේ පරිසරයක් ඇතිකිරීමට කටයුතු කිරීම.

මෙම පැමිණිල්ල තුළ ආදිවාසී නායකයින් ආයතන 10 ක් වගඋත්තරකරුවන් කර හඳුනාගෙන ඇත. එනම් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පරිසර අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, ඉඩම් අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ධීවර දෙපාර්තමේන්තුව සහ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දිවයින තුළ ජීවත්වන ආදිවාසී ජනතාවගේ හිමිකම් සුරක්ෂිත කිරීම සඳහා නිරන්තර අවධානයෙන් කටයුතු කරනු ලැබේ. ඊට ආසන්නතම සිද්ධිය ලෙස පසුගිය 2022 වසරේ දෙසැම්බර් මස 11 වන දින ඉගිණියාගල සේනානායක සමුද්‍රයේ මසුන් මැරීමට ගිය ආදිවාසී කණ්ඩායමක් අත්අඩංගුවට ගෙන රඳවා තබාගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදුකරන විමර්ශන දැක්විය හැකිය. ඒ සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් වෙතින් මේ වන විටත් කරුණු විමසා වාර්ථා ලබාගෙන ඇත. වැඩිදුර විමර්ශන කටයුතු තවදුරටත් සිදුවෙමින් පවතී.

එලෙසම ආදිවාසී නායකයින් ඉදිරිපත් කරන ලද මෙම පැමිණිල්ල සම්බන්ධව කඩිනම් පරීක්ෂණයක් ආරම්භ කර ඇත. ඒ අනුව ආදිවාසීන් සම්බන්ධ ගැටළු සහ එම ජනතාවට අදාළව පුද්ගල නීතියක් සකස් කිරීම සම්භන්ධව මූලික සාකච්ඡාවක් 2023 ජනවාරි මස 27 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ දී පැවැත්වේ. මෙම මැදිහත්වීම් පදනම්ව ආදිවාසී ජනතාවගේ හිමිකම් සුරක්ෂිත කිරීමට ඉතාමත් කඩිනම් සහ පළදායිව ක්‍රියාත්මක වීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව බලාපොරොත්තු වේ.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
2023.01.19